## ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගම -2016

ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** සමාගම පිහිටුවීම

1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතට අනුකූලව 1999 ජූලි 20 දින සිට බලපැවැත්වෙන පරිදි පෞද්ගලික සමාගමක් ලෙස 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබූ මෙම සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2008 ජූනි 16 දින නැවත ලියාපදිංචි කර තිබුණි.

**1.5** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

**2.2.1** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියන්හි පරිච්ඡේද 4 හි 4.5 වගන්තිය ප්‍රකාරව මාස හයකින් කල්පිරෙන රු. 6,926,566 ක ස්ථාවර තැන්පතු ජංගම වත්කම් ලෙස දැක්විය යුතු වුවත් ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ධාරණ අගය ශුන්‍ය වූ පිරිවැය රු.865,700 ක පරිගණක හා පරිගණක උපකරණ විකුණා තිබුණද ඒවායේ පිරිවැය සහ සමුච්චිත ක්ෂය අදාල ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ආ) රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණු රු.600,000 ණය මුදල 2016 ජනවාරි 11 දින පියවා තිබුණද ඊට අදාල රු.14,748 ක ණය පොලිය තවදුරටත් ගෙවියයුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.**

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
| --- | --- | --- |
| ලැබිය යුතු ආදායම් | 391,154 | ශේෂ සනාථන |
| ගෙවිය යුතු භාණ්ඩ හා සේවා බදු | 109,498 | බදු ගණනය කිරීමේ උපලේඛන |
| අස්පෘශ්‍ය වත්කම් | 29,500 | වටිනාකම තහවුරු කරගැනීමට අදාල ලිඛිත සාක්ෂි |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.**

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත | |
| (i) 39 (1) වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, රේඛීය අමාත්‍යවරයා විසින් පත්කරන ආණ්ඩුවේ අධ්‍යක්ෂවරුන්ගෙන් සහ කොටස් හිමියන් පත්කරන කොටස්කාර අධ්‍යක්ෂවරුන්ගෙන් සැදුම්ලත් 07 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත්, හතර දෙනෙකුගෙන් සමන්විත සමාගමේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර තිබුණි. |
| (ii) 42 (1) වගන්තිය | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ සඳහන් පරිදි සමාගමේ ප්‍රාග්ධනය රු. 100 සාමාන්‍ය කොටස්වලින් සමන්විත වියයුතු වුවද සමාගමේ සාංගමික සංස්ථාපත්‍රය පරිදි අනුදත් ප්‍රාග්ධනය රු.10 කොටස් 10,000,000 කින් සමන්විත වී තිබුණි. එයින් කොටස් 1,500 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට සහ කොටස් 2 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එවකට සිටි අධ්‍යක්ෂවරු දෙදෙනෙකු වෙත නිකුත් කර තිබුණි. |
| (iii) 45 (1) වගන්තිය | අධ්‍යක්ෂවරුන් අතරින් එක් අධ්‍යක්ෂවරයෙක් සමාගමේ සභාපතිවරයා ලෙස තෝරා පත්කර ගතයුතු වුවත් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සමාගමේ සභාපතිවරයා පත්කර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.814,640 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.389,210 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.425,430 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් රු.650,399 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.444,164 ක්ව පැවති සමාගමේ ශුද්ධ අලාභය 2016 වර්ෂයේදී රු.814,640 ක ශුද්ධ ලාභයක් ලෙස වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමිකය, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් හා ආදායම් බදු ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු.392,550 ක්ව පැවති සමාගමේ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.1,816,432 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
-------------------------

4.1 කාර්යසාධනය
----------------

සාංගමික සංස්ථා පත්‍රය අනුව සමාගමේ ප්‍රධාන අරමුණු ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත සිදුකරන භූමි සමීක්ෂණ, ගුවන් ඡායාරූපකරණය, චන්ද්‍රිකා ඡායාරූපකරණය , භූගෝලීය තොරතුරු පද්ධතිය, ගෝලීය පිහිටීම් පද්ධති මඟින් පස්, භූමි ආකෘති භූ ලක්ෂණ, ඉඩම් භාවිතය, වෘක්ෂලතා, ජෛව විවිධත්වය, ජලයේ ගුණත්වය ආදී පාරිසරික පරාමිතීන් සිතියම්ගත කිරීම, විශ්ලේෂණය කිරීම , භූ සම්පත් තක්සේරුව , භූ පරිහරන සැලසුම් , පාංශු ඛාදනය හා පාංශු රක්ෂණය, ආරක්ෂිත ප්‍රදේශ කළමනාකරණය, ශාඛ ඖෂධ වගාව හා තිරසාර කාබනික වගා පද්ධති සඳහා උපදෙස්දීම, සැලසුම් සකස්කිරීම සහ පුහුණු කිරීම විය. පාරිසරික වාර්තා ලබාදීම ආයතනයේ ප්‍රධාන කාර්යයක් වී තිබුණු අතර කාර්යය භාරගන්නා ආයතනයෙන් ලැබෙන මුදල් ආදායමක් ලෙසත්, කාර්යය ඉටුකර ගන්නා බාහිර පාර්ශවයට ගෙවන මුදල වියදමක් ලෙසත් ගිණුම්ගත කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තාක්ෂණික දැනුම සහිත කාර්ය මණ්ඩලයක් සමාගම සතු නොවූ බැවින් ලබාගන්නා වාර්තාවල නිවැරදිභාවය සහතික කිරීමේ හැකියාවක් සමාගම සතු නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඉඩමක ගස් ඉවත්කිරීමට අදාල පාරිසරික ඇගයීම් වාර්තාවක් සකස් කිරීම පමණක් සිදු කර තිබුණි.

(ඇ) සමාගම පිහිටුවා වසර 17 ක් ගත වී තිබුණද සාංගමික සංස්ථාපත්‍රයේ සඳහන් සමාගමේ අරමුණු ඉටුකරගැනීමට ක්‍රියාකාරී සැලසුම් සකස්කර නොතිබුණි.

**4.2** කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

දෙපාර්ශවය එකඟ වූ ගිවිසුමකින් තොරව මහවැලි අධිකාරියට අයත් නුවර පිහිටි ගොඩනැගිල්ලක සමාගමේ කාර්යාලය පවත්වාගෙන යන අතර මාසික කුලිය තීරණය කිරීමට කිසිඳු පදනම් ලියවිල්ලක් නොතිබියදී 2015 දෙසැම්බර් 31 දිනට ඊට අදාල ගෙවියයුතු කුලිය රු.600,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. පසුව එම ගෙවියයුතු මුදල කිසිඳු අනුමැතියකින් තොරව කපාහැර සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

**4.3** හඳුනාගන්නා ලද පාඩු

------------------------

සමාලෝචිත වර්ෂයේදී රු.1,532,265 ක් වටිනා ස්ථාවර තැන්පතු දෙකක් පුනරාවර්තන වියදම් දැරීම සඳහා කල්පිරීමට ප්‍රථම ඉවත් කර ගෙන තිබුණු බැවින් විගණනයේ ගණනය කිරීම්වලට අනුව ඒවායින් ලැබිය හැකිව තිබුණු පොළී ආදායම රු.70,574 ක් අහිමි වී තිබුණි.

**4.4** කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක් හා ඊට අදාලව බඳවාගැනීමේ කාර්ය පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් හෝ අනුමත කරගෙන නොතිබූ අතර සමාගමේ වර්තමාන කාර්ය මණ්ඩලය 03 දෙනෙකුගෙන් සමන්විත විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ගණකාධිකාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරිනියක් බඳවාගෙන තිබුණද ඒ සඳහා දැන්වීමක් ප්‍රසිද්ධ කර විධිමත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඇ) 2007 වර්ෂයේ සිට සමාගමේ කළමනාකරු වශයෙන් කටයුතු කරන නිලධාරියා හා 2014 ඔක්තෝබර් මාසයේ අනියම් පදනමින් ගිණුම් සහකාර තනතුර සඳහා බඳවාගත් නිලධාරිනියගේ සේවය 2016 වර්ෂයේ සිට විගණන දිනය වූ 2017 මැයි 19 දින දක්වා කාර්යපැවරුම් පදනමින් දීර්ඝකරමින් පැවතුණි.

**5** ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

--------------------------------------

**5.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 02 දින විගණනය වෙත ඉදිරිපත්කර තිබුණු අතර විගණනයේදී නිරීක්ෂණය වූ විවිධ ගිණුම්කරණ දෝෂ නිවැරදිකර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2017 ජූනි 29 දින නැවත ඉදිරිපත්කර තිබුණි.

**5.2** සංයුක්ත සැලැස්ම

-------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අංක 5.1.2 හා 5.1.3 වගන්ති අනුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම මූල්‍ය වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, භාණ්ඩාගාරය හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වූවත්, සමාලෝචිත වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්මක් සකස්කර හෝ නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

සමාලෝචිත වර්ෂයේ සමාගමේ කාර්යයන් කාර්යක්ෂමතාවයකින් මෙහෙයවීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් සකස්කර ඊට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

---------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස්කර නොතිබුණු බැවින් අයවැයගත දත්ත හා සත්‍ය දත්ත සැසඳිය නොහැකි විය.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | සමාගම සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක් හා බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර අනුමත කර නොගැනීම. |
| (ආ) | අයවැය පාලනය | අයවැය පිළියෙල නොකිරීම |